3 වන පිටෙන්

ණ්ඩුව වෙනුවෙන් වෘත්තීය සමිති නායකයෝ මේ කාර්යය භාර ගෙන තිබෙනවා.

ආණ්ඩුව මේ සමිතිවලට පූර්ණ අනුග්‍රහය දක්වනවා. අද හු[illegible]ක් වෘත්තීය සමිතිවල විලාසිතාව තමයි, තමන්ගේ සම්මේලනයේ ප්‍රධාන අමුත්තා ලෙස අදාළ ඇමතිවරයා සහභාගි කර ගැනීම. ආණ්ඩුව වෙනුවෙන් මේ සමිති කරන සේවාව වෙනුවෙන් ආණ්ඩුව ඔවුන්ගේ සාමාජිකත්වය වැඩි කර ගැනීම සඳහා අනුග්‍රහය පිරිනමනවා. මෙහි යම් බලහත්කාරයකුත් තිබෙනවා. සමිතිවලට රැවටෙන සාමාජිකයන්ගේ සල්ලි ටික සමිති නායකයෝ පිල්ලි ගහනවා.

මේ අලුත් වෘත්තීය සමිති ව්‍යාපාරයේ නිර්මාතෘවරයෙක් තමයි බාලා තම්පෝ. මේ බව සඳහන් කළ යුතුව තිබෙන්නේ සමහර තැන්වල ඔහු මහා වාමාංශික නායකයෙකු ලෙස හැඳින්වෙන නිසායි. ඇත්තෙන් ම ඔහු වෘත්තීය සමිති වානිජකරණය කළ නියමුවෙක්. ඔහු සම්බන්ධ වුණේ පෞද්ගලික අංශය සමග නිසා එහි ලොකු දූෂණයකින් තොරව හාම්පුතුන් සමග සාමූහික ගිවිසුම් හරහා මේ ව්‍යාපාරය ගජරාමෙට කෙරීගෙන යනවා. තම්පෝගේ විශ්‍රාම ගැනීමක් නැහැ. ඔහු තමයි ලංකා වෙළඳ සේවක සංගමයේ යාවජීව නායකයා.

තොන්ඩමන් පවුලේ ව්‍යාපාරයක් වන ලංකා වතු කම්කරු කොංග්‍රසය වෘත්තීය සමිති ව්‍යාපාරයේ දූෂිත නායකත්වය ආරක්ෂා කර ගැනීම සඳහා දේශපාලනය භාවිතා කිරීම ආරම්භ කළ පෞද්ගලික අංශයේ නියමුවා.

*අද වන විට වෘත්තීය සමිති කියන්නේ නෝබොඩීස්-වරුන්ට සම්බොඩීස් වෙන්නත්, සල්ලි ටිකක් හම්බ කර ගන්නත් භාවිතා කරන බිස්නස් එකක් වෙලා.*

රාජ්‍ය බලය වෘත්තීය සමිති ව්‍යාපාරය සඳහා උපයෝගී කර ගත් ප්‍රමුඛයන් අතර පැරණි වාමාංශික පක්ෂත් වෙනවා. ඒ අතරින් කොමියුනිස්ට් පක්ෂයට විශේෂ අපකීර්තියක් හිමි වෙනවා. පිටරට සල්ලි ලබා ගන්නා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය සමිති ව්‍යාපාරය යොදා ගැනීම පිළිබඳව. රුසියානු සල්ලි වෙනුවෙන් කොමියුනිස්ට් පක්ෂය විසින් කරන ලද වෘත්තීය සමිති ව්‍යාපෘති තමයි, ලංකාවේ වෘත්තීය සමිති රාජ්‍ය නොවන ව්‍යාපෘති බවට පත් වීමේ ආරම්භය.

අද වන විට ඇතැම් වෘත්තීය සමිති නාමිකව සිය ලියාපදිංචිය කම්කරු කොමසාරිස්වරයා යටතේ තබා ගනිමින් විදෙස් රටවලින් ලැබෙන අරමුදල්වලින් ව්‍යාපෘති කරනවා.

රාජ්‍ය අංශයේ ශක්තිමත් වෘත්තීය සමිති බිස්නස් අතර ඉදිරියෙන් ම තිබෙන ඒවා තමයි, ලංකා බැංකු සේවක සංගමය, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වැනි ඒවා.

රාජ්‍ය සේවයේ වෘත්තීය ශ්‍රේණියක් වැඩවසම් භික්ෂු නායකත්වයක් යටතට අරගෙන පවත්වාගෙන යන අධික ලාභ ලබන සාර්ථක වෙළඳ ව්‍යාපාරයක් තමයි, මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්ගේ රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය.

ජනතා විමුක්ති පෙරමුණත් තමන්ගේ අරමුදල ශක්තිමත් කර ගැනීම පිණිස වෘත්තීය සමිති ව්‍යාපාරයක යෙදී සිටිනවා. ඔවුන්ට පුංචි, පුංචි සමිති රැසක හිමිකාරිත්වය තිබෙනවා. සංවිධානමය වශයෙන් තිබෙන බලය ඔවුහු සිය ව්‍යාපාරය පවත්වාගෙන යන්නට උපයෝගී කර ගන්නවා. විදුලි බිලට එරෙහි උද්ඝෝෂණ දිය කර හැරීම සඳහා අසංවිධිත, අසාර්ථක වර්ජනයක් දියත් කරමින් ඔවුන් කටයුතු කළ ආකාරය අනුව පෙනී යන්නේ ඔවුන් එවැනි කොන්ත්‍රාත් ගන්නවා වෙන්නත් පුළුවන් කියලායි.

රජයේත්, එක්සත් ජාතික පක්ෂයේත් වෘත්තීය සමිති කියන්නේ දේශපාලනය වෙනුවෙන් ම අටවා ගත් වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් නමට පමණක් පෙනී සිටින සංවිධාන විශේෂයක්. ඒවා අවශ්‍ය වන්නේ නායකයන්ට දේශපාලන වශයෙන් බලවත් වෙන්නට විතරයි.

සමහර වෘත්තීය සමිති නායකයන්ට සාමාජිකයෝ නැහැ. මා දන්නා එක් නායකයෙක් සමිති සම්මේලනයක අයිතිකාරයෙක්. ඔහු මේ සම්මේලනය අයිති කර ගත් ආකාරය රසවත්. කිසියම් පොදු ප්‍රශ්නයකදී වෘත්තීය සමිති ටිකක් එකතු කරගෙන සම්මේලනයක් පිහිටුවා ගත් ඔහු එය ලියාපදිංචි කර ගත්තා. දැන් ඔහු සම්මේලන නායකයෙක්. සමිතියේ සාමාජිකයන් නැති නිසා සාමාජික මුදල් නැහැ. හැබැයි මිනිහා පූර්ණ කාලීනව නිදහස් වෙලා තමන්ගේ වැඩක් කරගෙන වැඩ නො කර පඩියත් ගන්නවා. වෘත්තීය සමිති සාමාජික සංඛ්‍යාව අනුව නායකයන් කීප දෙනෙකුට සමිති වැඩ කටයුතු වෙනුවෙන් නිදහස් වෙන්න තිබෙන අයිතියත් සමහරු දූෂණය සඳහා යොදා ගන්නවා.

අද වන විට වෘත්තීය සමිති කියන්නේ නෝබොඩීස්වරුන්ට සම්බොඩීස් වෙන්නත්, සල්ලි ටිකක් හම්බ කර ගන්නත් භාවිතා කරන බිස්නස් එකක් වෙලා.

හැබැයි මේ තත්වය සමස්තයක් ලෙස ම සමාජයට බලපාන කාරණයක් වෙලා. එක පැත්තකින්, වෘත්තීය සමිති බිස්නස් එකේ තිබෙන දූෂිතකම නිසා වෘත්තික ශ්‍රේණි ඒවායින් ඈත් වෙනවා. එතකොට ඔවුන්ට තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන්න ක්‍රමයක් නැහැ. අයිතිවාසිකම් අහිමි වීම නිසා අතෘප්තියට පත් වන වැඩ කරන ජනතාව සිය අසහනය පිට කරන්නේ වැඩ නො කර සිටී-මෙන් හා වැඩ ඵලදායිතාව පහත හෙළීමෙන්. අද වන විට රාජ්‍ය සේවයේ තිබෙන තත්වය මෙයයි.

ඵලදායිතාව අඩු වන විට ආණ්ඩුව කරන්නේ තව තවත් සේ-වකයන්ගෙන් කන්තෝරු පුරවන එක. ඔවුන් වැඩ කරන්නේත් අඩුවෙන්. අවසානයේදී මේ බර බර දරා ගන්නට සිදු වන්නේ බදු ගෙවන ජනතාවටයි.

පෞද්ගලික අංශයේ ආයතනවල අමුතු සංවර්ධනයක් දකින්න ලැබෙනවා. සේවකයන් වෙනුවෙන් වෘත්තීය සමිති හැදීමත් සිදු වන්නේ හාම්පුතුන්ගේ මැදිහත් වීමෙන්. සමහර සමිතිවල සභාපතිවරුත් හාම්පුත්තුමයි.

සමාජය තුළ සිදු වූ මේ වෙනස්කම් ග්‍රහණය කර නො ගෙන තවමත් පැරණි ආකාරයට ම වැඩ කරන ජනතාව සංවිධානය කරන්න පුළුවන් ය කියන ෆැන්ටසියක වාමාංශිකයෝ ජීවත් වෙනවා. පව්[illegible]

හැබැයි, වැඩ කරන මිනිස්සු ඔවුන්ගේ විමුක්ති දායකයන්ට වඩා ප්‍රායෝගිකයි. සීමාන්තික සූරාකෑම මැද පවා ඔවුන් කෙසේ හෝ නො නැසී පවතින්න ක්‍රමවේද නිර්මානය කර ගන්නවා.

නිදසුනක් ලෙස, ලෝක කම්කරු දිනය බිහි වන්න හේතු වුණ පැය අටේ වැඩ දිනය කියන දෙයට අද වෙලා තිබෙන දේ බලන්න. දැන් වැඩ කරන මිනිස්සු සිය විවේකය, විනෝදය අතහැරලා ඒ කාලයත් වැඩ කරන ක්‍රම තමයි, සොයන්නේ. වැටුප් දිනා ගන්නවාට වඩා මිනිස්සු අරගල කරන්නේ අතිකාල දීමනා ආදිය වෙනුවෙන්. නැතිනම්, පෞද්ගලිකව වෙනත් කටයුතුවල යෙදීමේ නිදහස වෙනුවෙන්.

## Cartoon by PK




## මනෝධ්‍යා ගේ සිහිනය සැබෑවෙයි



**2013 ජනවාරි මාසයේ සන්නසේ අපි මනෝධ්‍යා හසිනි පෙරේරා දියණිය ගැන ලීවෙමු. සිය 21 වන උපන්දිනය වෙනුවෙන් සාදයක් නොපවත්වා සාදයක් වෙනුවෙන් වැය වන මුදලින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට දස්කම් දක්වන දුගී දරුවකු වෙනුවෙන් නිවසක් තනා දීමට ඇය ගත් තීරණය සැමගේම පැසසුමට හේතු වුණා පමණක් නොවේ බොහෝ දෙනෙක් ඇගේ ඒ සත් ක්‍රියාවට දායක වූහ.**

**පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 161ක් ගත් බකමූණේ බුදුරුවයාය පදිංචි ජුලාංජලී පුෂ්පමාලී රත්නායක දැරිය නිවාසයක් ලබාගැනීමේ වාසනාවන්තිය වුවාය. ඇය වෙනුවෙන් ගෙයක් තනාදීමේ වගකීම පැවරුණේ පොල්ගස්ඕවිට සිංහ සමා-ජයටය.**





ජුලාංජලී දැරිය පදිංචිව සිටි පැල්පත

රුපියල් හත්ලක්ෂ හැට දහස් තුන්සිය පනහක මුදලක් මේ ව්‍යාපෘතිය වෙනුවෙන් එකතුකර දීමට මනෝධ්‍යා සහ ඇගේ සිතවතුන්ට හැකි විය.  මේ සත් කාර්යය නිමාකර ඒ කුඩා දැරිවියට නිවස බාර දීමේ උත්සවය පසුගියදා පැවැත්වුණි.



ජුලාංජලී දැරිය ය ලද නව නිවස





මේ උතුම් මෙහෙවරට දායක වූ කෝට්ටේ සන්තින්ද්‍රිය ස්වාමීන් වහන්සේ ඇතුළු සංඝරත්නයටත් අන් සැමටත් තුති පුදන්නට මනෝධ්‍යා ඇතුළු සියල්ල අමතක නොකරති.

අන්ධකාරයට සාප කරමින් නොසිට එක පහනක් හෝ දල්වමු. නාස්තිකාර සාද පවත්වන සැමගේ ඇස් ඇරේවා.

සන්නස